# බෝග නිෂ්පාදන වැඩසටහන - 2026
# பயிர் உற்பத்தி திட்டம் - 2026
# Crop Production Programme - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ පණිවිඩය

“පොහොසත් රටක් ලස්සන ජීවිතයක්” රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුගතව කටයුතු කරමින් රට තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා 2026 වසරට අදාල වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගැනීම වෙනුවෙන් අවැසි සියලු පියවර ගැනීම කෘෂිකර්ම ක්ෂේත්‍රයට වගකිවයුතු මධ්‍යම රජයේ, පළාත් සභා සහ මහවැලි ඇතුළු සියලු අංශයන්ගේ වගකීම වනු ඇත. එසේම එලබෙන 2025/26 මහ කන්නයේ සිට “පුනරුදයට අරුණළු” ජාතික ආහාර භෝග ප්‍රවර්ධන වැඩසටහනද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ තුලින් මෙම වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්කයන් ජය ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රවර්ධන වැඩසටහන් සහ ඒ සඳහා වන මාර්ගෝපදේශයන්ද අමාත්‍යාංශය විසින් ඉදිරියේදී සකසා ලබාදීමට අදහස් කරන අතර ඒ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විදිමත් පරිදි ඇගයුම් සහ ප්‍රගති සමාලෝචනයන් සිදු කිරීමට  පියවර ගන්නා ලෙසත් උපදෙස් දෙමි.

විශේෂයෙන්ම මෙම බෝග නිෂ්පාදනයන් අන්තර් පළාත්, පළාත් සභා සහ මහවැලි ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන බැවින් ප්‍රාදේශීය මට්ටමෙන් ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාල අංශ ඒකරාශී කර ගනිමින් මෙම කාර්යය මෙහෙයවීම අත්‍යාවශ්‍ය වේ. එම කාර්යය ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් කෘෂිකර්ම සංවර්ධන කමිටු ඔස්සේ සිදු කිරීම සඳහා දිස්ත්‍රික්  ලේකම්වරුන් සහ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන් අවශ්‍ය පියවර ගත යුතු බවත් දන්වමි. එසේම දිස්ත්‍රික් මට්ටමෙන් කෘෂිකර්ම අමාත්‍යවරයාගේ නියෝජිතයකු ලෙස කෘෂිකර්ම කටයුතු අධීක්ෂණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත් කර ඇති බැවින් දිස්ත්‍රික් කෘෂිකර්ම සංවර්ධන කමිටු ඔස්සේ මෙම ක්‍රියාවලිය මෙහෙයවීම වඩාත් පහසු වනු ඇත.

කෘෂිකාර්මික අංශයේ නව පුනරුදයක් ඇති කරමින් 2026 වසරට අදාල වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගැනීමේලා අවැසි වටපිටාව ගොඩනැගීමට කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු ඒ හා සම්බන්ධ ඉහත අදාළ ආයතනවල දායකත්වය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ඔබ සැමට අවැසි ශක්තිය හා ධෛර්ය ප්‍රාර්ථනා  කරන අතරම එම වගකීම වෙනුවෙන් කැපවීමට ඔබ සැමට ඇරයුම් කරමි.

ලාල් කාන්ත

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

## ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා ආර්ථිකය සමග අන්තර්ගතව පවතින කෘෂිකර්මාන්තය අද වන විට රටේ ස්ථායී සංවර්ධනයේ මූලික පදනමක් වී ඇත. භූගෝලීය හා දේශගුණික පිහිටීම අනුවද ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තයට හිතකර රටක් බැවින් ඒ සඳහා නවීන තාක්ෂණය, නව පර්යේෂණ හා යෙදවුම් කාර්යක්ෂමව යොදා ගැනීම තුලින් ගොඩනැගෙන තිරසර කෘෂිකාර්මික සංවර්ධනය අප රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට ඉවහල් වේ. තෝරාගත් බෝගයන්හි මෙරට අවශ්‍යතාවය, රටේ නිෂ්පාදනය තුළින්ම සපුරා ගැනීමත්, ආනයනය අවම කර අපනයන අවස්ථාවන් පුළුල්කර රටේ දළ දේශීය නිෂ්පාදිතයට සෘජු දායකත්වයක් ලබාදීමත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ මූලික අරමුණ වේ. ඒ සඳහා නව තාක්ෂණය, විද්‍යාත්මක කළමනාකරණ ක්‍රම සහ නවීන ප්‍රවනතා සමග යාවත්කාලීන වෙමින් ගොඩනැගෙන කෘෂි ව්‍යවසායකයින් බිහි කිරීමේ ලා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබයි.

රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් තිරසර කෘෂිකාර්මික සංවර්ධනය තුළින් සමාජ ආර්ථික ප්‍රගතිය ලඟාකර ගැනීම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ පවතින සියලු ආයතනවල ප්‍රධාන මෙහෙයුම වේ.

වාර්ෂික බෝග නිෂ්පාදන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මුලු රටම ආවරණය වන පරිදි (මධ්‍යම රජයේ සහ පළාත් සභා ප්‍රදේශ ඇතුලත්ව) අවශ්‍ය බෝග නිෂ්පාදන ඉලක්කයන් අතුලත්ව සකස් කර නිකුත් කරනු ලබන මෙම ග්‍රන්ථය ඉදිරි කන්නවල නිෂ්පාදන සැලසුම් ඉදිරිපත් කිරිමටත් තෝරාගත් බෝගවල කන්න ඉලක්ක සාධනීය ලෙස ජයගැනීමටත් ඉවහල් වේ.

2025/26 මහ සහ 2026 යල කන්නවල බෝග නිෂ්පාදන ඉලක්ක ඇතුලත් මෙම ග්‍රන්ථය සකස් කිරිම සඳහා සහයෝගය ලබා දීමට කටයුතු කල සියලුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්, කෘෂි සංවර්ධන අංශයේ නිලධාරීන් සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශයට ද මාගේ විශේෂ ප්‍රණාමය පුද කරමි.

ඩී.පී. වික්‍රමසිංහ

ලේකම්

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## කෘෂි සංවර්ධන අතිරේක ලේකම්තුමියගේ පණිවිඩය

කෘෂිකර්මාන්තයට හිතකර දේශගුණික හා භූගෝලීය පිහිටීම හේතුවෙන් ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ආහාර බෝග වලට අමතරව බෝග විවිධත්වයක් සහිත වැවිලි කේන්ද්‍රස්ථානයක් විය. එදා සිට මේ දක්වා කෘෂිකර්මාන්තය රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරන අතර දළ දේශීය නිෂ්පාදනයට සෘජුව දායකත්වයක් දක්වයි.

රට තුළ ආහාර අවශ්‍යතාවය සැපිරීමට පමණක් සීමා නොවී, ආනයනය අවම කිරීම, අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමට ද මෙම අමාත්‍යාංශය පුරෝගාමීව කටයුතු කරනු ලබයි. ‘තරුණ කෘෂි ව්‍යවසායකයින්’ යන සංකල්පය තුළින් රටේ ජවසම්පන්න තාරුණ්‍යය, නවීන තාක්ෂණයේ මුසුව ද සමගින් වඩාත් සුහුරු අන්දමින් කෘෂිකර්මාන්තය වෙත නැඹුරු කරලීමට මේ වන විටත් පියවර ගෙන ඇත. ඉන් නොනැවතී මී මැසි පාලනය, බිම්මල් වගාව යන පරාසයන් වෙත විහිදී ඇති මෙම කර්මාන්තය දිරිමත් කිරීම සඳහා එම කර්මාන්තකරුවන්ට නන් අයුරින් සහන සැලසීමට ද කටයුතු කර ඇත.

මෙම බෝග නිෂ්පාදන සැලැස්ම තුළින් රටෙහි ආහාර අවශ්‍යතාවය පදනම් කර ගනිමින් ඉදිරි ආහාර බෝග නිෂ්පාදනය සම්බන්ධ දත්ත, දිස්ත්‍රික් හා පලාත් මට්ටමින් විශ්ලේෂනාත්මකව හා සංසන්දනාත්මකව පුරෝකථනයක් ලබා දීමට කටයුතු කර ඇත.

2025/26 මහ සහ 2026 යල කන්නවල බෝග නිෂ්පාදන වැඩසටහන සකස් කිරීම සඳහා තොරතුරු ලබා දෙමින් සහයෝගය ලබා දීමට කටයුතු කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සියලු නිලධාරීන්ටත්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ඇතුළු අනෙකුත් අදාල නිලධාරීන්ටත්, සියලුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්ටත්, සියළුම පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා අදාල නිලධාරීන්ටත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ජල කළමනාකරණ අංශයේ අදාල සියළු නිලධාරීන්ටත්, අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) ඇතුළු එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇතුළු අදාල අනෙකුත් නිලධාරීන්ටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

අජිතා මානික්‍රම

අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්, හා වාරිමාර්ග අමාත්‍යාංශය

## CONTENTS


| | Page No. |
|---|---|
| **Summary** | |
| Paddy & Other Field Crops | 01 |
| Vegetable & Fruits | 02 |
| **Paddy Cultivation** | |
| **Paddy** | 03 |
| Target Paddy Cultivation by Administrative Area (Maha 2025/26 & Yala 2026) | 04 |
| Target Paddy Cultivation by Irrigation Type - Maha 2025/26 & Yala 2026) | 06 |
| Seed Paddy Availability (in Bushels) for 2025/2026 Maha and Forecast for 2026 Yala | 10 |
| **Other Field Crop Cultivation** | |
| **Other Field Crop** | 11 |
| Chilli | 12 |
| Big onion | 14 |
| Red onion | 16 |
| Green gram | 18 |
| Cowpea | 20 |
| Ground nut | 22 |
| Black gram | 24 |
| Soya bean | 26 |
| Maize | 28 |
| Gingerly | 30 |
| Finger Millet | 32 |
| Potato | 34 |
| OFC Certified Seed Availability for 2025/ 2026 Maha | 36 |
| **Vegetable Cultivation** | |
| **Vegetables** | 37 |
| Beans | 38 |
| Capsicum | 39 |
| Tomato | 40 |
| Cabbage | 41 |
| Carrot | 42 |

| | Page No. |
|---|---|
| Beet Root | 43 |
| Raddish | 44 |
| Knolkhol | 45 |
| Leeks | 46 |
| Long Beans | 47 |
| Bushitavo | 48 |
| Okra | 49 |
| Luffa | 50 |
| Snake Gourd | 51 |
| Bitter Gourd | 52 |
| Cucumber | 53 |
| Pumpkin | 54 |
| Brinjal | 55 |
| Winged Beans | 56 |
| Ash Plantain | 57 |
| Leafy Vegetables | 58 |
| Murunga | 59 |
| Indigenous Root & Tuber Crops | 60 |
| Manioc | 61 |
| Sweet Potato | 62 |
| **Fruit Crop Cultivation** | |
| **Fruits** | 63 |
| Banana | 64 |
| Pineapple | 65 |
| Mango | 66 |
| Passion Fruit | 67 |
| Papaw | 68 |
| Rambutan | 69 |
| Orange | 70 |
| Lemon / Lime | 71 |
| Avocado | 72 |
| Guava | 73 |
| Mandarin | 74 |
| Pomegranate | 75 |
| Water Melon | 76 |